*Vidyodaya J., Soc., Sc., Vol. 3, January-July, 1989, pp. 213-227.*

# අමුද්‍රිත සද්ධර්මරත්නාවලී ප්‍රාර්ථනා ගාථා පෙළක් හා චූර්ණිකා පාඨයක්*

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ

**විමල විජයසූරිය විසිනි**

පුරාවිද්‍යා කොමසාරිස් ආචාර්ය රෝලන්ඩ් සිල්වා වරක් ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය හමුවේ කළ දේශනයක දී තමා දන සිටි මෙරට වාස්තු විද්‍යා විෂයට අයත් විවිධ ග්‍රන්ථවල පුස්කොළ අත්පිටපත් දෙළහකින් පමණ අද මෙ රට ඉතිරි ව ඇත්තේ දෙක තුනක් පමණක් බව තමා මෑතක කළ සොයා බැලීමක දී හෙළි වී යයි කළ ප්‍රකාශය මා සිත් තුළ තදින් කාවැදී තිබිණ. සිංහල උරුමයේ විනාශය නිදහසින් පසු ශීඝ්‍ර වූ සේ ය. 1987 ඔක්තෝබර් සිට තෙ මසක් බැවේරියාවෙ මියුනික්හි Bayerische Staats Bibliothek Münchan (Orientab Teilung) රාජ්‍ය මහාපුස්තකාලයේ අත්ලිපි අංශයෙහි Dr. Günter Grönbold සහ Universität München (Indologie und Iranistik) මියුනික් විශ්වවිද්‍යාලයයේ Prof. Dr. Dieter Schlingloff යන දෙදෙනා ගේ මඟ පෙන්වීම යටතේ ලංකාව ඇතුළු බෞද්ධ රටවල අත්ලිපි සහ දනට මුළුමනින් ම අපවත් යයි සිතා සිටි, එසේ ම, දණ්ඩීන් ගේ කෘතියකැයි මෙ රට වියතුන් වරදවා පළ කොට ඇති, මිත්‍රධර ආචාර්යයන් ලියූ ඡන්දොවිචිති[1] ආදි අතිදුර්ලභ ගිල්ගිට් බෞද්ධ ග්‍රන්ථවල (අන් තැනෙක දක්නට නොලැබුණු) ජර්මන් ප්‍රකාශන ආදිය ද පරික්ෂා කෙළෙමි. විශේෂ අප්‍රකට සටහන් එකතු කෙළෙමි.

## ප්‍රාචීන ලේඛන

(එද බටහිර) ජර්මනියේ පර්යේෂණ පුස්තකාලය හතළිස් එකෙන් ප්‍රධානතමය වූ මෙය බැවේරියානු රාජ්‍ය බලය කූට ප්‍රාප්ත පහළොස් වන සිය වසේ සිට පළ වූ අති-දුර්ලභ පොත–පත, සඟරා, සිතියම්, රාජ්‍ය ලේඛන ආදියෙන් හා සියලු පුස්තකාලය අංගෝපාංගවලින් සම්පූර්ණ විය. මෙහි ඓතිහාසික ලිපි ලේඛන අංශයෙහි යුරෝපා, අප්‍රිකා, ආසියා අත්පොත්, අත්ලිපි ආදිය අතර විශේෂයෙන් සිංහල, දෙමළ, පාළි, සංස්කෘත චීන, තිබ්බත, නේපාල, බුරුම, සියම්, ජාවා ආදියේ ආසියාතික භාෂාවලින් ලියැවුණු ආගම, සාහිත්‍යය, දර්ශන, භාෂා, වෛද්‍ය, ජ්‍යොතිෂ්, ඉතිහාස ආදි විවිධ විෂයවලට අයත් අත්පොත් අත්ලිපි හා රාජ්‍ය ලේඛන විශාල සංඛ්‍යාවක් සුරක්ෂිත ව පරිහරණය සඳහා පහසු ලෙසත්, ක්‍රමවත් ලෙසත් ගබඩා කර ඇත. සිංහල අකුරෙන් පුස්කොළවල ලියූ ඉතා දුර්ලභ ඓතිහාසික ලේඛන රැසක් ද මේ අතර දක්නා ලැබේ.

බ්‍රිතාන්‍ය යුගයේ ලංකාවේ සේවය කළ සුදු රාජ්‍ය නිලධාරීන්, විද්‍යාඥයන් හා පඬිවරුන් අතර (මියලර්, බියුලර් ආදි) ජරමානු ජාතිකයන් එද සිට ම පෙරදිග ශිෂ්ටා-චාරයට අයත් දුර්ලභ පොත පත හා පුරාවස්තූන් වෙත දක්වූ ඉමහත් ඇල්මෙහි ප්‍රතිඵල වශයෙනි, අද මේ කෘති එහි සුරක්ෂිත ව ඇත්තේ.

---

* (මෙම පර්යේෂණ කාර්යය සාර්ථක කර ගැනීමට මුල් වූ හිටපු උපකුලපති කරුණාසේන කොඩි-තුවක්කු, අංශාධිපති මහාචාර්ය ඒ. වී. සුරවීර, නිර්මාණ ලේඛක ගාමිණී විජේසූරිය යන මහතුන් කෘතඥතා පූර්වක ව සිහිපත් කරමි.)

මෙහි කැටලොග්වල සඳහන් කිසි ම පොතක් නැති වී හෝ අස්ථානගත ව නොමැත. මේ දුර්ලභ අත්පිටපත් පවා ඉල්ලා විනාඩියක් ඇතුළත තමා ළඟට ම ලැබේ. එක් වර පිටපත් දහයක් ලබාගත හැකි ය. කිසිදු කෘතියක දුහුවිලි බිඳක් හෝ සතුන් කා දැමූ සිදුරු ආදියක් හෝ නොමැත. ඒවා එකිනෙක කුඩා පෙට්ටිවල අසුරා සුරක්ෂිත අන්තර්–ගර්භයක තැන්පත් කොට ඇත. අංකයට මුලින් යෙදූ අකුරුවලින් ඒවා කවර ජාතියක බසකින් ලියවිණි දැ යි හැඟවේ. Sinh, අක්ෂර යටතේ මා ඉල්ලූ පොත් සඳහා ලැබුණේ චීන අත්පිටපත් ය. සිංහල කෘති සඳහා ඔවුන් යොද ඇත්තේ Singh. යන අකුරු ය.

ශ්‍රී ලංකාව ආදි රටවලින් යුරෝපයේ ඉතාලිය, ඕලන්දය, ප්‍රංශය, මහාබ්‍රිතාන්‍යය, ස්වීඩනය ආදි රටවලට ගෙන ගිය අත්පිටපත්වලත්, ඉන්දියාව, තිබ්බතය ආදි රටවල පුස්තකාලයවල හා පෞද්ගලික පුස්තකාලයවල ඇති අත්පිටපත්වලත් සම්පූර්ණ විස්තර අඩංගු මුද්‍රිත නාමාවලි ග්‍රන්ථ දහස් ගණනක් පහත මාලයේ විවෘත ව තැන්පත් ව තිබිණ. අවාසනාවකට මෙන් බැවේරියා රාජ්‍ය මහාපුස්තකාලයේ තැන්පත් ව ඇති අපේ පොත්වල මුද්‍රිත ලිපි නාම — විස්තර සූචි ග්‍රන්ථයක් නො වී ය. එහෙත් Singh. අක්ෂර යටතේ නොම්මර යෙදූ කෘති සිය ගණනක යතුරු ලියනය කළ නාම මාලාවක් පමණක් මට සොයා ගත හැකි විය. එහි අංක යටතේ කියවා බැලූ මට තවමත් මෙ රට මුළුමනින් පළ නොවූ ලන්දේසි යුගය හා සම්බන්ධ රාජ්‍ය ලේඛන කිහිපයක් ඇතුළු අත්ලිපි ආදිය දක්නට ලැබිණ. එහි එක ද වාස්තු විද්‍යා ග්‍රන්ථයක් වත් නො වී ය.

මේවා අතර ඕලන්දයන් තමන් 'බලුගැත්තන්' ලෙස හඳුන්වා ගනිමින් "ශ්‍රී ලංකාවේ දෙවි මහාරාජෝත්තමයාණන් වහන්සේ" වෙත තමන්ට පළමු පරිදි ම දිවෙල් තනතුරු ප්‍රදානය කොට වදරන ලෙස වැඳ නමස්කාර කොට ඉල්ලා යැවූ පත් ඉරු හතක පුස්කොළ සන්නස[3] විශේෂ ය. මෙය එහි ලේඛනගත කොට ඇත්තේ Singh.—877 යන අංකය යටතේ ය.

මේ අංක යටතේ සිංහල අකුරෙන් ලියූ සිංහල පාළි සංස්කෘත භාෂාවලට අයත් ත්‍රිපිටක, අටුවා, ටීකා, ප්‍රකරණ, ශතක, සන්න පොත්, සාහිත්‍ය, ව්‍යාකරණ, ඡන්දෝ-ලංකාර මෙන් ම දේශීය කැඩුම් බිඳුම්, අර්ක—සර්පවිෂ ආදි වෛද්‍ය ග්‍රන්ථ සහ බලි තොවිල්, සූනියම් කැපීම්, ආදිය සම්බන්ධ ගීතිකා, යන්ත්‍ර, මන්ත්‍ර, ස්ත්‍රී වශීකරණ වැනි බොහෝ අමුද්‍රිත අත්පිටපත් ශතාධික සංඛ්‍යාවක් විය. එයින් **සද්ධර්මරත්නාවලි** පුස්කොළ අත්පිටපත් දෙකක් Singh. 35 සහ Singh. 36 යනුවෙන් ලේඛනගත කොට තිබිණ.

**Singh 35. සද්ධර්මරත්නාවලි** පුස්කොළ පිටපතේ පත් ඉරු අංක යොද ඇත්තේ ලිත් ඉලක්කම්වලිනි. (ෙ..............) පොත අග පිටුව "ජඅෙක්ෂ" යන අංක සහිත ය. එහි "........යන් සේක. අසූ දහසක් අවුරුදු ජීවත්වන සේකැ යි සලකා නිවන් රස අනුභව කිරීමෙන් සුඩිය කළ යහපති"

"සද්ධම්මට්ඨිති.............."
"දසබල සෙලප්පභවා...........චිරං පවත්තන්තු"
"ධම්මං සෙවනතො සයනතො..............තිපිටකධරෝ.............."*
"සබ්බඉෂ්ටාර්ථ සිද්ධි."
යන ගද්‍ය පද්‍ය පාඨවලින් ග්‍රන්ථය අවසන් වේ.

---

* සද්ධර්මරත්නාවලි (ප්‍රා.)—ii, පිට 863.
"ධම්මස්සෙනවතො'ථවා යසවතො . . . තිපෙඨකධරො . . ."

මේ අත්පිටපතේ ග්‍රන්ථාවසානය දැනට සිංහල අකුරෙන් පළ වී ඇති සියලු ම **සද්ධර්ම රත්නාවලී** මුද්‍රිත ප්‍රකාශනවලට බෙහෙවින් අනුරූප ව ඇත. (ප්‍රාචීන භාෂෝපකාර සමාගම සංස්: 'සිද්ධිරස්තු' මෙහි 'සබ්බ ඉෂ්ටාර්ථ සිද්ධි' ය.)

**මුද්‍රිත සංස්කරණ හත**[3]

(1) 1894 වෙරගම පුංචිබණ්ඩාර (2) 1914 වෙ. ඉන්දජෝති, (3) 1925 රොබට් බටුවන්තුඩාවේ (4) 1928 බෙන්තර සද්ධාතිස්ස (5) 1936 ශ්‍රීමත් ඩී. බී. ජයතිලක සහ (6) (මෙම කෘති නොවෙනස් ව පිටපත් කොට පළ වූ) 1961 කිරිඇල්ලේ ඤාණවිමල සහ (7) කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මහාචාර්යවරුන් හා සෙසු හිතෛෂීන් පිරිසක් ද සහාය කොට කොළඹ ප්‍රාචීන භාෂොපකාර සමාගම විසින් සංස්කරණය කරවා (i) 1985, (ii) 1986 කාණ්ඩ දෙකකින් පළ කළ සද්ධර්මරත්නාවලිය (ප්‍රා.) ද යන මුද්‍රණ හතට ම මේ අත්පිටපත නොවෙනස් ය.

කිරිඇල්ලේ සංස්කරණයෙහි අතින් දමා ඇති (ප්‍රක්ෂිප්ත) පාඨයක් වූ "පූජ්‍යාචාර්ය ධර්මසේන යතීශ්වරයන් ලියූ සද්ධර්මරත්නාවලී නම් වූ ප්‍රබන්ධය මෙතෙකින් නිමියේ ය."[4] යන වැකිය මෙහි ද නොදක්නා ලැබේ.

**ධර්මසේන හිමි**

මේ හැර සාහිත්‍ය වංශ කථාව ලියූ නූතන ගත්කතුවරයන්ට ද සද්ධර්ම රත්නාවලීකාර ධර්මසේන හිමියන් පිළිබඳ ග්‍රන්ථාභ්‍යන්තරයෙන් ද අමතර කිසිදු තොරතුරක් මේ තාක් ලැබී නැති බව මේ ප්‍රකාශවලින් ද අනාවරණය වේ. (ගම්පළ යුගයේ ධර්මකීර්ති මාහිමි-යන් ගේ **නිකාය සංග්‍රහයෙහි** සඳහන් '**ධර්මසේන ය**'[5] යන්නත්, **දහම් ගැටය**[6] නම් ප්‍රහේලිකා පද්‍ය ග්‍රන්ථයේ කර්තෘ ලෙස **දහමගැට පදර්ථයේ** සඳහන්[7] "**ධර්මසේන තෙරුන් ය**"[8] යන්නත් හැර වෙනත් තොරතුරක් සද්ධර්ම රත්නාවලී පිටපතකින් නම් සොයා ගෙන නැති බව යි, මේ ප්‍රකාශවලින් හෙළි වන්නේ.

ආචාර්ය චාල්ස් ගොඩකුඹුරේ මෙ සේ කියයි.

"Apart from this statement (-"Saddhammatthiti... akāsi......") nothing more is known about this Thera"[9]

සන්නස්ගල සිංහල සාහිත්‍ය වංශයෙහි ද "සද්ධම්මට්ඨිති............යන පාළි ප්‍රබන්ධ-යෙහි ධර්මසේන නම් හිමියාණ කෙනකුගේ නිපැද්මෙකි යි සඳහන් ව ඇත. නිකාය සංග්‍රහයෙහි පැනෙන (23 පිට) ධර්මසේන නම මේ හිමි සඳහා ලියැවී ඇති බවත්, එතුමා දඹදෙණි කාලීන මහ වියතකු බවත් අවිවාදයෙන් මෙ රට පඬුවන් විසින් පිළිගනු ලැබ ඇත. ඒ මිස මේ හිමි ගැන අනෙක් වංහුං කිසිවක් දැන ගන්නට නැත."[10] යනු එයි.

**සිංහල සාහිත්‍යය**—2 ලියූ මහාචාර්ය ආනන්ද කුලසූරිය ද සමාන අදහසක් දක්වයි. "සද්ධම්මට්ඨිතිමිච්ඡන්තො............(1032 පිටුව) සද්ධර්මයේ චිරස්ථිතිය කැමැති ධර්මසේන නම් යතිවර තෙමේ මේ උතුම් වූ සද්ධර්ම රත්නාවලිය කළේ ය යනු එහි අර්ථ යි. නම සඳහන් වන වෙනත් තැන් ද ඇත. සදහම් රුවන යැයි ද කියනු ලැබේ. (288 $^{1-3}$ 523 $^{14}$ 675 $^{14}$ 1000$^{5}$)"

"අන්‍ය බොහෝ සිංහල ගත් කරුවන් මෙන් ම මොහු පිළිබඳ ව ද වෙන කිසි දු ආරංචි මාත්‍රයක් ග්‍රන්ථයෙහි නැත. බැහැරින් ද එය සොයා ගැන්ම උගහට ය. ගත් කතුවරයන්ගේ රචනා ශක්තිය හා කතන්දර කීමේ ශූරතාව ග්‍රන්ථයෙන් ම හෙළි වෙතත්,

ඔවුන්ගේ වතගොත පිළිබඳ කිසිවක් ඉන් නො කියැවේ. මේ ධර්මසේන හිමි කවර කලෙක කොතැනක විසී ද හෝ එතුමා ගේ චරිතය සම්බන්ධ ව විස්තරයක් හෝ කිසි තැනෙක දත නොහැකි ය. නිකාය සංග්‍රහයෙහි — ධර්මසේන හිමි රත්නාවලී කතුතුමා යයි සිතිය හැකි ය..........''[11]

ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, කිරිඇල්ලේ ඤාණවිමල ආදීන්ගේ සංස්කරණවල ප්‍රස්තාවනා ආදියෙහි ද නිකාය සංග්‍රහයේ සටහනට අමතර ව කර්තෘ පිළිබඳ අන් යමක් සඳහන් නො වේ. එහෙත් ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම (1985 — 1986) පළ කළ සද්ධර්ම රත්නාවලී සංස්කරණයෙහි ද්විතීය භාගයෙහි අවසාන (863) පිටුවෙහි අටවන අධොලිපියෙන් මෙසේ දැක්වේ. ''මින් (''යෙනෙසා රතනාවලී.........සිද්ධිරස්තු'' යන්නෙන්) අනතුරුව පහත සඳහන් කොටස ඇතැම් පිටපත්හි* පෙනේ.'' යනුවෙනි.

**'' ඉමිනා පුඤ්ඤකම්මේන යාව බුද්ධො භවාම' හං**
**මහොසධො ච ඤාණෙන ජොතිසෙට්ඨී ච භොගිනා**
**වෙස්සන්තරො' ච දානෙන හොතු මය්හං භවාභවෙ**
**ගංගාය වාලුකා ඛීයෙ උදකං ඛීයෙ මහණ්ණවෙ**
**මහයා මත්තිකා ඛීයෙ ලක්ඛෙන මම බුද්ධියා—''**
**'' මේ ලී පින් පුරා — විඳ සව් සැපත් විතරා**
**නො වැද බිය සසරා — මම ද බුදු වෙම් වා ලොවුතුරා** ''[B. J.]

(ප්‍රා. සද්ධර්ම රත්නාවලී 683 පිට බලන්න.)

මේ කොටසත් සමග තවත් පාළි ගාථා රාශියක්, බැවේරියාවේ මියුනික් රාජ්‍ය මහා පුස්තකාලයේ Singh. 36 සද්ධර්මරත්නාවලී පිටපතේ ඇත. ''පූජා'' පුස්කොළ පත් ඉරුවේ (ඉදිරි පිට) **''අසූ දහසක් අවුරුදු ජීවත් වන සේකැයි සලකා නිවන් රස අනුභව කිරීමෙන් චිත්ත ශුද්ධිය කළ යහපති''**

(1) ''සද්ධම්මට්ඨිතිමිච්ඡන්තො ධම්මසෙන යතිස්සරො
අකාසි පවරං එතං සද්ධම්මරතනාවලිං

(2) දසබලසෙලප්පභවා නිබ්බාණමහා[1] සමුද්දමනුයායී
[2]'අට්ඨංගිකමග්ගසලිලා ජිනවචන[3] නදීචිරම්පවත්තන්තු

(3) [1]ධම්මස්සෙවනතො' ඨවා'[2] සයනතො ධම්මෙන ධම්මද්ධජො
පුණ්ණින්දුජ්ජුතිධම්මසෙන ඉති යො ථෙරො මහාවිස්සුතො

(4) ජෙතං සො සුචිරං[1] තිපිටකධරො සාධුහි සම්භාවිතො
යෙනෙසා රතනාවලී විරචිතා සද්ධම්මවංසුබ්භවා

(5) [1]සබ්බ ඉෂ්ටාර්ත්ථ සිද්ධි

---

* A - අඹේපුස්සේ තලගම රජමහාවිහාර
B - මාතර පොල්හේනේ පදුමාරාම
C - වැලිගම අග්‍රබොධි රජමහාවිහාර
D - ගාල්ලේ ගිංතොට ථූපාරාම විහාර
E - තෙල්වත්තේ පුරාණ තොටගමු විහාර
F - කඩුගන්නාවේ සියඹලාගොඩ පොත්ගල් විහාර
G - මහනුවර මුරුතලාව සූරියගොඩ නරේන්ද්‍රාරාම
H - මීවනපලාන පුහුවල ගංගාතිලක විහාර
I - පැල්මඩුල්ල රජමහාවිහාර
J - ගම්පහ යටවත්ත පහළගම විද්‍යාරවින්ද පිරිවෙන
K - මාතලේ දෙඹවෙල රජමහාවිහාර අත්පිටපත (ප්‍රා. සද්ධර්මර. i, පිටු, x-xi)
ජ - මුද්‍රිත ජයතිලක සංස්කරණය

(6) 'ඉමිනා පුඤ්ඤකම්මෙන යාව බුද්ධො භවාමහං
මහොසධොව ඤාණෙන ජොතිසෙට්ඨීව භොගිනා
වෙස්සන්තරොව දනෙන හොතු මය්හං භවාභවෙ

(7) ගංගාය වාලුකා ඛීයෙ උදකං ඛීයෙ මහණ්ණවෙ
[1]ම(හියා) මත්තිකා ඛීයෙ' [2]ලක්ඛෙන මම බුද්ධියා

(8) ඉමං [1]ලිඛිත පුඤ්ඤෙන වරං සංසාරසාගරෙ
තික්ඛපඤ්ඤො සදා හොමි දිබ්බ චක්ඛු භවන්තු මෙ

(9) අක්ඛරං එකමෙකං ච බුද්ධ[1] (රූප) සමං සියා
තස්මා හි [2]පණ්ඩිතො පොසො ලිඛෙය්‍ය පිටකත්තයං

(10) 'මේ ලි පින් පුරා විඳ සව් සැපත් නිතොරා
නො වැද බිය සසරා මම ද බුදු වෙමි වා ලොව්තුරා
නුවණැත්තන් කෙ(රෙ) අග්‍ර වෙමි වා
තුන්තරා බොධියකට පැමිණෙන්නට හේතු වේවා
නීරොගී වෙමි වා, සිද්ධිරස්තු''

**අප්‍රකට ප්‍රාර්ථනා ගාථා**

(11) ඉමිනා පුඤ්ඤකම්මෙන' ඉතොහං දුතියෙ භවෙ
උප්පජ්ජිත්වා සුරාවාසෙ සුන්දරෙ තුසිතෙ පුරෙ

(12) මෙත්තෙය්‍යලොකනාථස්ස සුනන්තො ධම්ම දෙසනං
තෙන සද්ධිං චිරං කාලං වින්දන්තො මහතිං සිරිං

(13) බුද්ධෙ ජාතෙ [1]මහාසත්තෙ රම්මෙ කෙතුමතීපුරෙ
[2]විප්පෙ වංසෙ ජනිත්වාන තිහෙතුපටිසන්ධිකො

(14) චීවරං පිණ්ඩපාතං ච අනග්ඝං විපුලං වරං
සෙනාසනං ච භෙසජ්ජං දත්වා තස්ස මහෙසිනො

(15) සාසනෙ [1]පබ්බජිත්වාන ජොතෙන්තො තමනුත්තරං
[2]ඉද්ධිමා සතිමා සම්මා ධාරෙන්තො පිටකත්තයං

(16) [1]ව්‍යාකතො තෙන බුද්ධොයං හෙස්සතීති අනාගතෙ
උප්පන්නුප්පන්නබුද්ධානං දනං දත්වාන තෙහිපි
(ව්‍යාකතොයෙව බුද්ධොයං හෙස්සතීති අනාගතෙ)*

(17) සංසාරෙ සංසරන්තොව කප්පරුක්ඛොව පාණිනං
ඉච්ඡිතිච්ඡිතමන්නාදිං දදං චිත්තසමාහිතො

---

* (16) අදහස සම්පූර්ණ වීමට තුන්වන පාදයක් තිබෙන්නට ඇත. එසේ... යෙදීමි.
(16) ප්‍රථම පාදයට සමාන වීම නිසා දෙවැන්න අපවත් වන්නට ඇත.

(18) සීල නෙක්ඛම්මපඤ්ඤාදිං පූරෙත්වා සබ්බපාරමිං
පාරමීසිඛරං පත්වා බුද්ධො හුත්වා අනුත්තරො
(19) දෙසෙත්වා මධුරං ධම්මං ජන්තූනං සිවමාවහං
සබ්බං සදෙවකං ලොකං මහාසංසාරබන්ධනා
මොචයිත්වා වරං ඛෙමං පාපුණෙය්‍ය සිවං පදං

(20) පුඤ්ඤෙනා'නෙන පප්පොමි නිබ්බුතං යාවතාවහං.
උප්පජ්ජෙය්‍යකුලෙ සුද්ධෙ සබ්බෙ අඩ්ඪෙ මහද්ධනෙ

(21) අසෙසදෙසභාසාසු කලාසු සකලාසු ච
කුසලො ලොක[1]පණ්ඩිච්චෙ[2] වද්ධනිච්චධනෙසු ච

(22) පිටකෙසු ච වෙදසුතෙ- කාව්‍ය[1](ව්‍යා)කරණෙසු ච
තක්කාදිසු පනඤ්ඤෙසු සත්ථෙසු ච විසාරදො

(23) කවී චාගමකො වාදෙ පරවාදප්පමද්දනො
එකස්සුතිධරො'නෙක සහස්සානම්පි ගන්ථතො

(24) ගන්ථසතසහස්සම්පි සුතමත්තෙන ධාරයෙ
අත්ථව්‍යඤ්ජනතො වා'පි සහස්සනයතො පි ච

(25) වසා සීහස්ස පක්ඛිත්වා යථා කඤ්චනපාතියා
සිලාලෙඛෙච[1] මෙනිච්චං [2]සුත(ං) සබ්බං න නාසයෙ

(26) මහිද්ධිකො මහාතෙජො කතඤ්ඤූ කුසලො බලී
ධිතිමා ජාති සම්පන්නො [1]භවෙය්‍ය (ං) [1]ජාතිජාතියං

(27) අතෙකිච්ඡා'පි යෙ රොගා තෙ මයා [1]පෙක්ඛිතෙ...
නිස්සෙසා ව්‍යපගච්ඡන්තු උදබින්දුව පොක්ඛරා

(28) [1]දසිකසුත්තමත්තම්පි යං කිංචි මම සන්තකං
රාජචොරප්පියා සත්තා අග්ගිනා උදකෙන වා

(29) න විනස්සන්තු මෙ භොගා [1]වාය්හං ඩය්හ උය්හරෙ
රොග[2] ව්‍යාධන්තරායා තු න පප්පොන්තු කුදචනං

(30) හිතමිත්තෙන සත්තානං භණෙය්‍ය මධුරං ගිරං
පරොපි මං න හිංසෙය්‍ය (න[1] හිංසෙය්‍යං) පරම්පි ච

(31) අදණ්ඩෙන අසත්ථෙන [1]දමෙහ(ං) සබ්බපාණිනං
නිරයෙ ච තිරච්ඡානෙ පෙතෙ අසුරයොනියෙ

(32) යං යං හි[1]දුක්ඛං තං සබ්බං න පුසෙය්‍යං කුදචනං
කුදිට්ඨී පාපමිත්තං ච න [2]සෙවෙය්‍ය (ං) කුදචනං

(33) පංචානන්තරියං කම්මං පංච දුච්චරිතංපි ච
පාණඝාතෙ පරද්දණ්ඩෙ පරදරපටිග්ගහෙ

(34) මුසාවාදෙ සුරාපානෙ නො වෙ නප්පවත්තතු
දසකම්මපථාදීනි පංච දුච්චරිතම්පි ච

(35) න කරොමි න චින්තෙමි න භාසෙමි භවෙ භවෙ
බාලං න පස්සෙ න සුතෙ ච බාලෙ
න සංවසෙ ('[1] ⏑ — — ⏑ — ⏑ ⏑)
බාලෙන'ල්ලාප සල්ලාපං — න කරෙ න ච රොචයෙ

පූජ්‍යෘ (ප. ඉ.) — 1

(36) ධීරං පස්සෙ සුණෙ ධීරෙ ධීරෙන සහ සංවසෙ
ධීරෙනල්ලාපසල්ලාපං තං කරෙ න[1] ච රොචයෙ

(37) දෙවා මනුස්සා අසුරා ගන්ධබ්බා යක්ඛරක්ඛසා
තෙපි මං අනුරක්ඛන්තු [1]භවෙය්‍යුං සරතො මම

(38) පටිසන්ධි මානුසී භොගා [1]වාසනා පිටකත්තයෙ
දනසීලමයා [1]පඤ්ඤා මම හොතු භවාභවෙ

(39) යානි සිප්පානි ලොකස්මිං අණුංථුලානි සබ්බසො
තානි[1] සබ්බානි සිප්පානි සයං සිඩා භවන්තු මෙ

(40) ඉච්ඡිතං පත්ථිතං මය්හං ඛිප්පමෙව සමිජ්ඣතු
සබ්බෙ පූරෙන්තු චිත්තසංකප්පා චන්දො පණ්ණරසී යථා

(41) යථා අනෙන පුඤ්ඤෙන යසාධිකෙන
දනෙන ඤාණෙන ච සුස්සරෙන
භොගෙන රූපෙන කුලෙන [1]වාග්ගො
බුද්ධො භවිස්සාමි අනාගතෙසු
......සිද්ධිරස්තු......ශුභමස්තු......[2]ආරොගාමස්තු
......විජයොස්තු......[3]සමුද්ධිරස්තු......[4]නවවාධිත......සිද්ධිරස්තු......

පූජ්‍යෘ (ප.ඉ.) — ii

හිස් ය. අනතුරු ව, අංක නැති පත් ඉරුවක මේ අනුමෝදනා වාක්‍යය දක්නා ලැබේ:—

(42) ත්‍රිභුවනෛකතිලකසක[1] (ල)' ඥෙය සාගරපාරගතාශෙෂ [2]ගුණරත්න
[3]මන්දිරායමානන්ත දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ ගරුඩ මනුජ භුජග ගාන්ධර්ව
සිද්ධ විද්‍යාධර ප්‍රමුඛා'නෙක සර්ව සත්වාභිමතාර්ථප්‍රදනානර්ඝ්‍ය
කල්පද්‍රුම සංකාස වූ බුද්ධ ධම්ම සංඝ සංඛ්‍යාත රතන ත්‍රය ශරණ පරායණ
ශ්‍රද්ධා බුද්ධි සම්පන්න දන ශීලාදී අනෙක ප්‍රකාර කුශල ක්‍රියාවෙහි තත්පර වූ
සත්පුරුෂ ජනයන්ට ධර්මශ්‍රවණාර්ථ ප්‍රයෝජන සර්වඥශාසනොපකාර
පිණිස [4]සභා

තවද—ඉතා භයංකර වූ දකුම් ඇති තිරිසනුන් ගෙන් ගැවසී ගත්තා වූ අග්නි ජාලාවෙන් නිරන්තර වූ එහෙයින් ම ආස්වාද රහිත වූ [5]සජීව කාලසූත්‍රාදී අට මහානරකයෙහි හා එයට පිරිවර වූ සොළොස් වැදැරුම් ඔසුපත් නරකවල්හි ද යන එක්සිය සතිසක් නරකයෙහි ද සිතින් වත් නො සිතිය හැක්කා වූ නොයෙක් දුකට භාජන වූ, යොදුන් ගණන් දිග මහත ඇති තිමි, තිමිංගලාදි ජලමත්ස්‍යයන් සහිත වූ, බලු කපුටු ඈ තිරිසන් ජාතියෙහි ද බුද්ධාන්තරයක් කල් ගියත් බත් පැන් තබා, සෙම් සොටු පමණකුත් නොලැබෙන්නා වූ, ඉතා

භයංකර වූ දුක් ඇති ප්‍රෙත ලොකයෙහි ද, කල්පයක් දවස් ගියත් ඉර සඳ එළියක් නො පෙනෙන්නා වූ, ලොකාන්තරික නරක යයි කියන ලද ඝොර වූ දුක් ඇති [6]කාලකංජ නම් අසුරයොනියෙහි ද යන සතර අපායෙහි හා අරූතල [7]අස(ං)ඥතලයන් සහිත වූ පිට සක්වළෙහි ද, පූර්වවිදෙහාදී සෙසු තුන් දිවයිනෙහි ද නො ඉපද බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ අග්‍රශ්‍රාවක චක්‍රවර්ති ආදී නරොත්තමයනට උත්පත්ති ස්ථාන වූ දඹදිව මධ්‍ය දේශයෙහි ම උපදිමින් නියත මිථ්‍යාදෘෂ්ටි නො ගෙන සම්‍යග්දෘෂ්ටිය ම ගන්නා සුලු, උභතො ඛ්‍යඤ්ජන ස්ත්‍රී[8] පණ්ඩක නපුංසක අන්ධ ගොළු බිහිරි කොර පිළු උන්මාද අපස්මාර හා දුර්දර්ශනීය වූ ගඬ පොළ සොරි සිලන්ද්‍ර ව්‍රණ [8]කස් කිලාසාදි රොග පීඩාවන් නැතිව, සහස්‍ර කිරණ [9]මකර තෙජස ඇති වෙමින් රන් කඳක් මෙන් බබළන්නා වූ ශරීරයෙන් යුක්ත ව, කිසි කලෙකත් භය සන්ත්‍රාස රහිත වූ සිත් ඇති ව, [10]හීන නීච වූ අඩු කුලයෙක නො ඉපිද, මහඩන මහාභොග ඇති ත්‍රිවිධ මහාසාරාදී උතුම් වංශයෙහි උභයකුල පරිශුද්ධ වූ මව් කුස උපන් කල්හි නිර්මල වූ රන් රුවක් මෙන් පිටතට [11]පෙනෙ(න් නා)හු මව් පිය ආදීන් සතුටු කරවමින් දස මස් ඇවෑමෙන් සැප සේ මව් කුසින් බිහි ව, ශුක්ලපක්ෂාභිවර්ධමාන චන්ද්‍ර මණ්ඩලානුකාරයෙන්[12] ක්‍රමාභිමුඛව, උපන් තැන් පටන් එම කුලයෙහි දස විධ රත්නයෙන් හා ධන ධාන්‍යර්ධීන් හැම කල්හි ම අනූන ව, ක්ෂෞම කොශෙය්‍යාදී වූ වස්ත්‍ර ජාතියෙන් හා හස්ත්‍යශ්වගවමහිෂග්‍රාමක්ෂේත්‍ර වස්තු ආදිය ඇතිව, සුවච කීකරු වූ ද දස පුත්‍ර දරාවන් හා එබඳු වූ ම පරිවාර සම්පත් ලබමින් දිව්‍යලොක මනුෂ්‍ය ලොකාදී උප-නුපන් තන්හි සියලු සම්පත්තියෙන් හා රූප සෞන්දර්‍ය්‍යයෙන් සියලු දෙව් මිනිස් ආදීන් අභිභවනය කරවමින් මහපොළොව සේ මහත් වූ ප්‍රඥව ඇති ව, සියලු ශිල්ප ශාස්ත්‍රයෙහි දක්ෂ ව, මේ සෙයින් සප්ත කාමස්වර්ගයෙහි ප්‍රමාණාතික්‍රාන්ත සකල සම්පත්ති ප්‍රයෝජන විඳීමෙන් අනතුරුව, ත්‍රිවිධ බොධියෙන් එක්තරා බොධියකට පැමිණ නිවන් අත් පත් කිරීම බණ පොත් [13]ලියවූවවූවන් විසින් සිද්ධ [14]කරණ්ඩ පූළුවන් බව එම ධර්මයෙන් ම අසා සිත සතුටු වූ හෙයින් අප විසිනුදු මෙ යථොක්ත ප්‍රකාර වූ සියලු අනුසස් ලබමින් කෙළවර නිවන් පුර වදිනා පිණිස — ලොකත්‍රයට අසහාය ප්‍රදීපයක් බඳු වූ, ලොව්තුරු බුදුන් විසින් ඒ කාරණ මුල් ව, සකල සත්වානුකම්පාවෙන් නිර්වාණාභිමුඛ කොට වදළ ධර්ම-පදනුක්‍රමයෙන් ප්‍රවෘත්ත වූ සද්ධර්මරත්නාවලී නම් වූ පොත් වහන්සේ නමක් ලියවා ලිපිකාර සංග්‍රහ පිණිස රිදී පිළී මීහරක් ආදී වූ සියලු පල වගෙන් ම පනම් විසිතුන් දස් පන්සියයක දේ බැර පැන් දෙමින් ශ්‍රී ශුද්ධ ශක රාජ වර්ෂයෙන් [15]එක්වා දහස් සසිය හැට හයට පැමිණි මෙම වර්ෂයෙහි දී ආතත විතත ඝන [16]සුසිර ප්‍රභෙද නොයෙක් තූර්‍ය්‍ය ඝොෂා-භිරාම වූ බාද්‍ය [17]හොද්‍ය ලෙය්‍ය පෙය්‍ය දනොස සමාකුල දීපධූපසුගන්ධ පුෂ්පොපහාර සාධු නාද ක්‍රීඩාදී මහොත්සවයෙන් යුක්ත ව, ධර්ම දේශනා කරවමින් අප්‍රමාණ ප්‍රීතින් ප්‍රමුදිත ව, ධර්ම ශ්‍රවණය කිරීමෙන් පින් රැස්කරගත් බව ය. අප විසින් කරන ලද්ද වූ සියලු ම කුශල රාශිය—සමස්ත ශ්‍රී ලංකාධිපති වූ [18]අප ගේ දෙව් මහ රාජොත්තමයාණන් වහන්සේට ද, සියලු [19]අමාත්‍ය මණ්ඩලයට ද ස්ත්‍රී [20]පුරුෂාදී වූ නොයෙක් ජනයන්ට ද ශක්‍ර, බ්‍රහ්ම, විෂ්ණු, මහේශ්වරාදී සියලු [21]දෙයි දේවතාවන්ට ද, නරක තිරිය ප්‍රෙත අසුරකාය යන සතර අපායෙහි දුක් විඳින සත්වයන්ට ද අනන්තාපරිමාණ[22] සක්වළ සකල ප්‍රාණීන්ට ද තම තමන් සිය අතින් කළ දෙයක් මෙන් පින් සිද්ධවූව මැනවි.''

**සංස්කරණය හා පාඨාන්තර***

2 — 1 මහාසමුද්දපරියන්තා (ප්‍ර.ජ.G.,), මහාසමුද්දමනුයායී (**BDEHIJK** බැ)

2 — 2 අට්ඨංග (ජ)

2 — 3 නදී චිරං පවත්තතු (ප්‍රා) නදී චිරං වහතු (G.ජ.) නදීචිරම්පවත්තන්තු (ගංගාවෝ බොහෝ කල් පවතිත්වා!) ප්‍රථමා බහුවචන රූප— දෙකින් (—නදී, නදියො) එකකි.

* 216 වන පිටුවේ අධෝලිපියේ අත්පිටපත් හා ඒවා නම් කළ රෝමන් අකුරු ආදිය එයි.

3 — 1 ධම්මසෙවනතො (බැ), ධම්මස්සෙනවතො (ප්‍රා) ධම්මං සෙවන්තො

3 — 2 **යසවතො** — (ප්‍රා) සයනෙතා —

4 — 1 **තිපෙටකධරො** (ප්‍රා) වඩා නිවැරදියි. **තිපිටකධරො** (බැ.)

5 — 1 සිද්ධිරස්තු — (ප්‍රා)

6 — 1 සහ 7 ,8, 9, 10 පද්‍ය හා පාඨ වෙනත් කෘතිවල අත්පිටපත්වල ද එයි.

7 — 1 **මහාසා** (ප්‍රා)

7 — 2 ලක්ඛෙණ — (සද්ධර්මාලංකාර — බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය සං. 2494 පිට 18,)

8 — 1 **ලිඛිත** — 9 — 2 **ලිඛෙයා** මින් පිටපත් කිරීම ගැනේ.
1 **අකාසි** 4 **විරචිතෝ** මින් ගැනෙන්නේ කතුවරයාගේ රචනය යි.

9 — 1 (රූප) පිටපතේ නො ඒ.

9 — 2 පඩිතො (බැ.)

13 — 1 **මහාසත්තෙ** (බැ.) දෙවරක් ලියවී තිබේ.

13 — 2 **විප්පෙවංසෙ** — මෛත්‍රෙය බුදුරජාණන් වහන්සේ උපදින කුලයේ මේ කලට බමුණුකුලය වඩා ශ්‍රෙෂ්ඨ හෙයිනි.

15 — 1 **ඩ** — ඛබ 19, 20,

15 — 2 **ඞ** — **ද්ධි**

16 — 1 (ව්‍යාකතොයෙව...........අනාගතෙ) මේ පාදය පිටපතේ නැත. 15. ද්විතීය පාදය සමාන නිසා මෙය අතහැරෙන්නට ඇත. එය යෙදූවෙමි.

21 — 1 පඩිද්වෙ, 21 — 2 වඩ

22 — 1 කාව්‍යාකරණේසු ච (බැ.), (ව්‍යා) — ඌන යි.

25 — 1 'ඩ' (බැ.) — ච්ච

25 — 2 සුත්ත (බැ) 'සුතං' විය යුතුය.

26 — 'භවෙය්‍ය' උත්තම පුරුෂ එක වචනය නිසා 'ං' තිබිය යුතු ය.

27 — 1 **පෙක්ඛිනෙ**.........(බැ.) 'තෙ මයාපෙකක්ඛණෙ' (ඒවා ම විසින් එක මොහොතකින්) යන්න සඳහා වූ ලේඛක දෙෂයක් විය යුතුය. (මයා + අපි + එකක්ඛණෙ)

28 — 1 **දසික** (බැ.) (දවල්ලෙහි) ඇඳුම්වාටියෙන් ගැළවී යන නූල් පොටක් පමණක් යන්න සඳහා 'දසික සුත්ත මත්තම්පි' යෙදුණා සේ ය. **හෙරණ සිඛයෙහි** (කැලිගම විජිත සංස්. 1985. 1 පිට 111) 'දූනැ දූනැ දනා අයත් ද හූ වැලයකුදු සොර සිතින් ගත පරිජි වේ.'

29 — 1 '**මායහං ඩය්හ උය්හරෙ** (බැ.)
රාජ — චොර — අප්පියා සත්තා මෙ භොගා මාය්හං (රජු — සොර සතුරු අය මගේ සම්පත් පැහැර නො ගන්නේය) 'අග්ගිනා — උදකෙන වා මෙ භොගා මා **ඩය්හඋය්හරෙ**' (ගින්නෙන් දියෙන් මගේ වස්තුව නො දැවෙන්නේ ය. ගසා නොයන්නේ ය.)
**මාය්හං** — වාය්හං විය යුතු ය යි සිතේ. (√ වහ් + යණ්)

29 — 2 **ව්‍යාධින්තරායා** (බැ.) ව්‍යාධි + අන්තරායා (පූර්වස්වර ලෝපයෙන්) '**ව්‍යාධන්තරායා**' විය යුත්ත' ව්‍යාධින්තරායා'' යයි ලියවිණ.
**පප්පොන්තු** බහුව. — ක්‍රියාවේ උක්තය **ව්‍යාධන්තරායා** ය.

30 — 1 (න හිංසෙය්‍යං) (මම අනුනට ද හිංසා නො කරමි) යන්න සඳහා ද ගාථා පාද පූරණය සඳහා තිබිය යුතු මෙය මුලින් යෙදුණු 'හිංසෙය්‍ය' නිසා හැලෙන්නට ඇත.

31 — 1 **දමෙහ** (බැ) — 'දමෙ + අහං' (මම හික්මවමි) 'දමෙහං' විය යුතු

32 — 1 දුක්ඛන්තං (බැ) වෘත්තභග්න වන නිසා 'දුක්ඛං–තං' විසන්ධි ව තිබීම යොග්‍ය යි.

32 — 2 සෙවෙය්‍ය (බැ) 'අහං සෙවෙය්‍යං' විය යුතු '**ඵුසෙය්‍යං**' මෙනි

33 — 1 **දුඩරිත** (බැ.) ඩ — ච්ච සඳහා වූ පුස්කොළ අකුරයි.

35 — 1 ගාථාවේ තුන්වන පාදයේ අග ('බාල ජනෙන සද්ධිං' වැනි කොටසක් හැලී තිබේ.

36 — 1 'න' (බැ] 'න ච රොචයේ' විරුද්ධාර්ථ යි. ("තං ච රොචයෙ") විය යුතු ලෙඛක දෙෂයෙන් බින්දුව නොපෙනී 'ත' = න වූ සේ ය.

37 — 1 'අනුරක්ඛන්තු, භවෙය්‍යං සරතො මම' (රකිත් වා, මා, සිහි කරන විට ම වෙත් වා) යන්න අනුව භවෙය්‍යුං' විය යුතු ය.

38 — 1 'වාසනා පිටකත්තයෙ' (බැ.) (තුන් පිටකය කියවීම, ඉගැන්වීම යන අරුත විය යුතු නිසා 'වාචනා' ලෙඛක දෙෂයෙන් 'වාසනා' වන්නට ඇත.

38 — 2 '**දන සීලමයා පුඤ්ඤා**' විය යුතු ය.

39 — 1 **ඩ** (බැ.) — ඞ්බ

41 — 1 '**වාගො**' (බැ.) 'ච' ග්ගො' (ච + අග්ගො) ලියවුණ සැටි යි.

41 — 2 **ආරොගය්‍යමස්තු** සඳහා යෙදිණ.

41 — 3 '**සමෘද්ධිරස්තු**' සඳහා යෙදිණ.

41 — 4 නො තේරේ — වර්ෂය දැක්වීමකැ යි සිතේ.

**අනුමෝදනා වාක්‍යය**

1 **සකශෙදය** (බැ.) සක (—ල—)ශෙදය

2 **ගුණරතන** රතන (බැ.) පාලි යි.

3 **මන්දිරායමානන්ත** (බැ.) — මානාන්ත විය යුතු ය.

4 **සහා** (බැ.) සහ නිපාතය යි. ගායනය පිණිස දීර්ඝ යි. රාජාවලි (ඒ. වී. සුරවීර, 1976, ප්‍රස්තාවනා) 6 පිට "යොදුන් හා" බලන්න*

5 — 6 **සජීව** කාලජජ (බැ) '**ඤ්ජ**' සඳහා පුස්කොළ ලේඛනය යි. සමහරුන් "ජ' අක්ෂරය සිංහල හෝඩියෙන් කපා හැර තිබේ.

7 අසංඥතලයන් — අසංඥතලයන්

8 **පඩක** (බැ) 'පණ්ඩක'
කස්කිලෙසාදි (බැ) (කාශ, කුෂ්ට) පාළි 'කිලාස'

9 මතර (බැ) මාත්‍ර, තාර (?)

10 **හීන නීච වූ අඩු කුලයක** — 13.2 බලන්න
ධර්මප්‍රදීපිකා (ශ්‍රී ධර්මාරාම, 1951, පිට 347)
"මෙහි උච්චාකුල නම් ක්ෂත්‍රිය කුලය, බ්‍රාහ්මණ කුලය යි"
**ධර්මප්‍රදීපිකා** (එම) (පිට 190)
'මිනිස් පියෙහි උපදනෙ රජ කුලෙහි හො බමුණු කුලෙහි හො උපද්දී. මේ දෙකුලයෙන් අනෙක් නීච කුලයෙක්හි නො උපදනෙය.'
**ධම්පියා අටුවා ගැටපදය** (ඩී. බී. ජයතිලක, 1933 පිට 217)
"නීච කුලේ වා — කුදු කුලෙහි එවු වෙස්ස කුල දු සුදුරු කුල දු මෙ තැනැ නීච කුල නමි"

---

* අස්ගිරියේ තල්පත (මැන්දිස් රෝහණදීර, 1969) 2-20. පිටු 'හා' වාක්‍ය සමාප්තියේ දිගට ම යෙදී ඇත. ගද්‍ය ග්‍රන්ථ ඇද පැද කියවීමේ මෙකල සිරිත නිසා දීර්ඝ ව 'හා' යයි වෙනස් වන්නට ද ඇත.

11 **පෙනෙහු** (බැ)

12 ක්‍රමාභිවෘද්ධ ව

13 'ලියවවූවන්' — (ලියවූවන්) හෝ ලියූවන් ලියවූවන්' යන්නේ විකෘති පාඨයක් විය හැකි ය..

14 කරඩ (බැ) කරණ්ඩ (කරනට, කරන්ට, කරන්න මෙන් නො ව) '—ණ්ඩ බටහිර ලංකාවේ සුලභ ප්‍රාදේශික ව්‍යවහාරයකි.

15 වර්තමාන පාලන වර්ෂ ක්‍රමය සඳහා ඉතා උචිත ව්‍යවහාරය යි, 'රාජ වර්ෂ' යන්න.

16 සුසිර (පාළි), ශුශිර (සංස්.)

17 හොද්‍ය (මිශ්‍ර රූපයකි). සංස්කෘත, භොජ්‍ය' ය. බාද්‍ය යන්නට අයථාසාදෘශ්‍ය යි.

18 'අපගේ දෙවි මහ රාජොත්තමයන් වහන්සේ '(බැ) මෙහි රාජවර්ෂය 1666 ය යි සඳහන් නිසා මුළු ලංකාව පාලනය කළ මේ රජු අතිප්‍රතාපවත් 11 **රාජසිංහ** (කන්දඋඩරට කිරුළු පළන්) මහරජු (1635 – 87) බව නිසැක ය.

19 අමාජ්ත (මිශ්‍ර රූපයකි.) අමාත්‍ය (සංස්.) අමච්ච (පාළි — දෙමළ). අමාජ්ත, අස්ප, නස්පැත්ති ආදිය මේ ගණයේ ය.

20 'පූර්ෂ' (බැ) පුරුෂ (සංස්.) බ්‍රි. යුගයේ වැසිකිළිවල මේ ව්‍යවහාරය ''පූර්ෂයින්ට'' යයි නො නැසී පැවතී තිබේ.

21 'දෙයි දෙවතාවුන්ට'' (සිං.) වහරේ එයි. දෙය්යා—යෝ

22 'සක්වල' (බැ) — කව — සක්වළ

**නිගමනය**

මෙහි 1 — 5 තෙක් (අප විසින් අංක යොදන ලද) පද්‍ය පාඨ දෙකෙන් ම පෙනෙන්නේ, සද්ධර්මරත්නාවලි පොත එතැනින් අවසන් කොට ඇති බව ය. ''ධර්මසෙන යතීශ්වර' (නාහිමි) අතිප්‍රසිද්ධ ය. ත්‍රිපිටකධර ය. සාධූන් විසින් සම්භාවිත ය. ඒ ධර්මසෙන ස්ථවිරයන් **සද්ධරමරත්නාවලිය** රචනා කළ බව ය, ඉන් කියවුණේ.

අනතුරු ව එන 6 — 10 තෙක් පද්‍ය පාඨ දෙකෙන් ම කියවෙන්නේ, මෙය ලියූ පිනින් බුදු බව පතන බව යි. සමකාලීන පූජාවලිය (**බුද්ධපුත්‍ර** හිමියන් විසින් ලියා ඇත්තේ ද, ii වන පැරකුම්බා රජු ලවා බුදු බව ප්‍රාර්ථනා කරවීමට ය. මේ රජු (කලිකල් සවැනි නිරිඳු) කව්සිළුමිණ ලියන ලද්දේ ද, බෝසත් සර වැනුම් වියතුන් අතර ජනප්‍රිය කරවීමට ය. සියල්ලෙහි ඇත්තේ එක ම කාලීන පොදු අරමුණකි.

මෙහි නට වන ගාථාව කියන්නේ ධර්ම ග්‍රන්ථ ලියන්නා ලියන එක් එක් අකුර බුදු පිළිමයක් වන බවකි. එ හෙයින් පිටකත්‍රය ම ලිවිය යුතු බවකි. මෙය ද **ධර්මසේන** හිමියන් ධර්ම ග්‍රන්ථවල පිටපත් සුලභ කළ යුතු බවට කරන ආයාචනයක් නො වේ ය යි මෙය ප්‍රතික්ෂේප කළ නො හැකි ය. මේ කොටස බැවේරියා පිටපතේ ද, ප්‍රා. සංස්කරණයෙහි ද එහි සඳහුන් බොහෝ පිටපත්වල ද ඇතත් සමහරක නො ඒ.

මේ අන් එකක වත් නො ලැබෙන 11 — 41 තෙක් ගාථා පාඨවලින් ප්‍රකාශ වූයේ, කතුවරයා නිම කළ මේ සුවිසල් ව්‍යායාමයේ මහ පිනින් පැතෙන පැතුම් හා අනාගත අරමුණු නො වේ යයි කාට කිව හැකි ද? මේවා ද පිටපත් කරුවකු ගේ අදහස් හා රචනා ය යි අනුමාන කළ හැකි නමුත්, එය වඩාත් ගැළපෙන්නේ, සුවිසල් වැඩක් සපුරා නිම කළ ගත් කතුවරයා ගේ ම අපේක්ෂා හා අරමුණු ප්‍රකාශ කිරීමක් ය යි කිව හොත් ය. තමන් ගේ උතුම් කාර්යය පිළිබඳ මෙතරම් සවිස්තර දීර්ඝ වාර්තාවක් අයත් විය හැක්කේ,

බරපැන් දීමනා ගෙවනු ලැබූ පොත් පිටපත් කරන්නකුට හෝ කරවන්නකුට නො ව, ඒ මහාව්‍යායාමය නිම කළ ග්‍රන්ථ නිර්මාතෘවරයාට ම ය යි නිගමනය කිරීම වඩාත් නිවැරදි ය යි සිතේ. මෙහි ද 41 ගාථා පාඨ දෙකින් ම පෙනෙන්නේ ද ග්‍රන්ථාවසානයකි.

ඒ අනුව සමකාලීන ජන සමාජය ආගමික වශයෙන් හෙළා දුටු නා නා අඩුපාඩු, දුසිරිත් ප්‍රතික්ෂේප කිරීමත් සාරධර්ම හා පරමාර්ථ වශයෙන් ඇගයූ සමාජ හරයන්, ගුණ දහම්, දක්ෂතාදිය අපේක්ෂා කිරීමත් මේ ගාථාවල අඩංගු ය. 41 වන ගාථාවෙන් අවසාන වශයෙන් අපේක්ෂා කරන ගුණාංග කීපයක් නම්, විශාල ප්‍රසිද්ධිය, පරිත්‍යාගශීලී ගුණය, බුද්ධිය, මනා මිහිරි කට හඬ, වස්තුව, රුමත් බව හා කුලවත් බව යි.

මෙ සේ ධර්මසෙන තෙරුන් මේ සා විශාල ග්‍රන්ථයක් රචනා කොට නිමවා, එහි පිටපත් කීපයක් ද ලියවා, එහි අගට කිහිප ආකාරයක (බලාපොරොත්තු හෙළි දරවූ කරන) ප්‍රාර්ථනා ගාථා සමූහයක් සංග්‍රහ කිරීමත්, පසු කලක ඒ පිටපත් කිහිපය නැවත පිටපත් කිරීමේ දී ඒවා අග තුබූ විවිධ ගාථා ඛණ්ඩ ආදිය එකතු කොට, එක් පිටපතක් සම්පාදනය කළ අයකු අතින් මේ බැවේරියානු අත් පිටපත පිළියෙල වීමක් සිදු වී ඇතැ යි නිගමනය කළ හැකි ය. ග්‍රන්ථාවසානයන් ලෙස සැලකිය හැකි අවස්ථා කීපයක් මෙම පිටපතේ අගට එක් වූයේ කෙසේ දැයි විසදිය හැකි එක් ක්‍රමයකි, මෙය.

මෙහි අග සංග්‍රහ කළ, මේ අත් පිටපතට පමණක් සීමා වූ ගාථා රාශිය අන් අත් පිටපත්වල නොලැබීමට ද කිසියම් හේතුවක් තිබිය හැකි ය. නිදසුනක් වශයෙන් බොහෝ අත් පිටපත්වලින් අග කොටස් (පත් ඉරුවක් හෝ ඉරු) ගිලිහී ගොස් ඇති බවටත්, ඉතා කලාතුරකින් පිටපත් එකක දෙකක පමණක් අග වූ (කර්තෘ සන්දර්ශනාදී පද්‍ය) කොටස් ශේෂ වූ අයුරුත් දක්වීමට **මයූර සන්දේශය, හංස සන්දේශය, ලෝකොපකාරය හා ජානකීහරණ** මහාකාව්‍යය ද සාධක කළ හැකි ය. **වැලිපටන්විල ශ්‍රී දීපංකර** නාහිමියන් අත් පිටපත් දහසයක වහලින් එහි පෙළ සංස්කරණය කොට, සිංහල පදනුගත සන්නයක් ද පළමුවරට ලියා (1910, විද්‍යා සාගර) මුද්‍රණයෙන් පළ කරත් දී **ගුරුළුදම් මුනුබුරු කිවිසුරු** කිවින් කර්තෘ බවට සඳහන් කර්තෘ සන්දර්ශන පද්‍යය හමු වී ඇත්තේ ඉන් අත් පිටපත් දෙකක පමණි. එනම්, සපරගමු දිසාවේ ගම්සභා විනිශ්චයකාර කරුණාතිලක සෙනෙවිරත්න සහ බී. ගුණසේකර යන මුදලිවරුන් දෙදෙනකු සතු ව තුබූ අත් පිටපත් දෙකෙහි පමණි.[12] හංස සන්දේශ කර්තෘ වීදගම **මෙත් මහනෙත් පාමුල** තෙරිඳුන් ය යි සඳහන් පද්‍ය ශේෂ ව තුබුණේ, තමාට ලැබුණු අත් පිටපත්වලින් එකක පමණක් බව එය මුලින් සොයා ගත් ගන්දර **.පී ඩී. ඇස්. වීරසූරිය** පඬිතුමා සඳහන් කරයි.[13] එසේ ම ලෝකෝපකාරයේ කර්තෘ රනස්ගල්ලේ තෙරුන් ය යි එතෙක් වියතුන් විසින් පිළිගෙන තුබූ මතය, බිඳ ලන ලද්දේ, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධියක් සඳහා අත් පිටපත් අටක් (පිටු 3–4) ඇසුරෙන් **ලෝකෝපකාරය** සංස්කරණය කළ ආචාර්ය **ඇම්. එච්. පීටර් සිල්වා** වියතුන් විසිනි.[14] අපවත් **ජානකීහරණ** මහාකාව්‍යයේ පෙළ පුනරුත්ථාපනය කිරීමට **රත්මලානේ ශ්‍රී ධර්මාරාම** නාහිමියන් ඇසුරු කළ සියලු ලංකා අත් පිටපත්වලින් කර්තෘ සන්දර්ශන ශ්ලෝක හතරේ පාඨ ශේෂයන් ස්වල්පයක් සමග සර්ග 15 වෙහි ශ්ලෝක 22 තෙක් කොටස පමණි., (සන්නවල) හමු වී තුබුණේ.[15] එහෙත් කර්තෘ නාම සන්දර්ශන ශ්ලෝක සතරත් සමග සර්ග 20 ම විශේෂයෙන් සොයා, මහාචාර්ය සෙනරත් පරණවිතාන, ආචාර්ය සී. ඊ. ගොඩකුඹුරේ යන මහාවිද්වතුන් දෙදෙනා විසින් ලංකාවේ දැනට පළ කොට ඇත.[16]

මෙහි එක්තරා පුදුමයක් නම්, ලංකාවේ ලියවුණු පුස්කොළ අත්පිටපත්වල බොහෝ විට ම නෂ්ටප්‍රාය වී ඇත්තේ අග කොටස් ය. එහෙත් තිබ්බතයේ භෝට භාෂාවෙන් ලියා තිබී සොයාගත්, (ලංකාවේ උපන් හ යි පිළිගත් සිංහල, රාජපුත්‍ර **ආර්‍යචන්ද්‍රපාදයන්ගේ චතුශ්ශතකයෙහි**[17] ද නේපාලයේ නේවාරි අකුරෙන් ලියා තිබී හරප්‍රසාද් ශාස්ත්‍රීන් විසින් මෙන් ම **පාතේල්** හා විධුශේඛර භට්ටාචාරීන් විසින් ද පළ කරනු ලැබූ චිත්තවිසුද්ධි-

ප්‍රකරණයෙහි[18] ද බිහාරයෙන් සොයාගත් **සිංහලාචාර්ය රත්නශ්‍රීඥන පාදයන් (රතැසිපා) ගේ කාව්‍යලක්ෂණරත්න ශ්‍රී** ටීකාවේ[19] ද එක ම පිටපතෙහි පවා අපවත් වී ඇත්තේ, මුල කොටස හෝ මුල් (පුස්කොළ) පත්ඉරු යි. මේ අනුව **සද්ධර්ම රත්නාවලියේ** පුස්කොළ අත්පිටපත් විශාල සංඛ්‍යාවකින් ලේඛක ප්‍රාර්ථනා ගාථා පෙළක් ම බැවේරියාවේ එක ම අත් පිටපතේ පමණක් ශේෂ වූයේ මෙබඳු හේතූන් නිසා යයි අනුමාන කළ හැකි ය.

**ආශ්‍රිත කෘති හා උපග්‍රන්ථ**

1. Dieter Schlingloff - Chandoviciti (Texte zur Sanskritmetrik) - Akademie, Verlag, Berlin, 1958, p. 34, ii

    (A) මිත්‍රධරෙණ (C) කෘතිඃ (D) ඡන්දොවිචිතිඃ........''

2. Singh - 877 :—

(1) ''∩ ∩ ∩ ස්වස්ති ශ්‍රී ප්‍රශස්තවර සර්වමංගල්‍ය විකශිතවර කමල මෞලි සමලංකෘත පුළුවිපති සරසි නිහිත ප්‍රඵුලකර චරණ කමලොපෙත සමස්ත සත්ත්ව ලොකෛක මාණික්‍ය ප්‍රදීපායමාන රවිවංශ කුල කමලරාජ හංස සමුපචිත නෛක දිගන්තරාකීර්ණ යසො කීර්ති ප්‍රතාපානුරජිත නානාවිධ ශාස්ත්‍රපාරගතාශෙෂ ගුණරතන මන්දිරාය නිවාසභූත සකල කලා වල්ලභ සකල විචජ්ජනාධාර

(2) ∩ ∩ ∩ රාජාධිරාජ රාජපරමේශ්වර වූ ∩ ∩ උතුම් ∩ ∩ අපගේ දෙවි ස්වාමිදුරුවාණන් වහන්සේගේ මහාවාසලට කායවාක්මනෝ යන ද්වාරත්‍රයෙන් අකලංක නිෂ්කලංක වූ නිර්මලචිත්තයෙන් ඒකාන්ත පක්ෂ පිරමාන අතිවිශ්වාස වූ භක්ති ප්‍රේමාතිභාරාවන තෝත්තමාභයෙන් යුක්තව සොඳ සිතින් දුක් ගැන සිටිනා ප්‍රේත්‍රෝස්පොයිස්ත කියන ගොවේර්ණදෝරු උන්නාන්සේට බොහෝ සේ

(3) ∩ ∩ ∩ දෙවියෝ වැඩ සලස්වා දෙනු පිණිස පෙන්වා එවන සරූප නම් ∪ ∪ අතිසූර සංග්‍රාම සුධීරතර තෙජාභිරාම වූ ∪ ∪ උතුම් ∩ ∩ අප ගේ දෙවි ස්වාමිදුරුවාණන් වහන්සේ ගේ ∪ ∪ උතුම් වූ ∪ ∪ මහවාසල සැදී යෙදී සිටින ප්‍රධානි රදලවරුන්නෝ නමට තමුන්නාන්සේ විසින් පිටත්කර එවූ කඩදහි පත්‍රය හා ∩ ∩ සකවර්ෂ එක්වා දහස් සසිය පණහක්වූ කීලක නම් මේ වර්ෂයෙහි මැදින්දින්

(4) ∩ ∩ ∩ මශ පූර සැටවක් නම් තිථියලත් සෙණසුරාද පස්වරු බාගේ දී මෙතනට ගෙනවිත් ලන්වූනා මෙම කඩදහි පත්‍රය ඔප්පු ගණිමින් එහි පෙනි තිබුනුවග වාසගම් බලා උල්පට්ටු වූ තැනේ දී ∩ ∩ ශ්‍රී රංජිත පවර භුජ මන්දිර සුරභි සුරපාදකල්පලතානු-සාර වූ ∩ උතුම් ∩ අප ගේ දෙව් ස්වාමිදුරුවාණන් වහන්සේ ගේ මහවාසලට ඒකාන්ත පක්ෂ පිරමාන වූ ∩ ∩ ∩ ∩ ∩ ∩ ∩ ∩

(5) සොඳ සිතින් දුක් ගැණ සිටිනා ගොවේර්ණදෝරු උන්නාන්සේට........''

1980 **සාහිත්‍ය** උත්සව විශේෂ කලාපයේ ඒ. ඇස්. හෙට්ටිආරච්චි මහතාට ඇස්. පනාවත්ත මහතා සැපයූ **''ජර්මනියේ බැවේරියාවේ මියුනිච් රාජ්‍ය පුස්තකාලයේ තිබී 1933 .5 .5 දින ආර්. ඇස්. විසින් පිටපත් කොට ගෙනා පුස්කොළ ලිපිය''** යනුවෙන් එම සඟරාවේ 15–21 පිටුවල **''සියම් උපසම්පදාව පිළිබඳ පැරණි ලේඛන''** යන ශීර්ෂය යටතේ පළ වූ ලිපියක් ඇත. එහි පළ වී ඇත්තේ, මෙහි දෙවන තල්පතේ ඇතුළත් ''ස්වස්ති ශ්‍රී ප්‍රශස්තවර වීරවික්‍රම ප්‍රතාප ශ්‍රී ලක්ෂ්මී නිවාස භූමන්දිර ශත්‍රු දර්ප්ප මර්ද්දන ප්‍රවාහභාෂකර........'' ආදි ලේඛන අර්ධයක් පමණි.

ඓතිහාසික අත් ලිපි සඟරාවේ (Second Report of the Historical Manuscripts Commision, Report of the 1935, p. 49, Appendix, vii.)

රඹුක්වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ හිමියන් තමන් ඒ ලිපිය පිටපත් කොට ගෙනා බව ප්‍රකාශිත නමුත්, මෙම ලේඛනය නොදුටු සාහිත්‍ය ලිපි කර්තෘ 'ආර්. එස්.' යන්න ගැන සැකකොට ඇත. මේ අනුව මේ ඓතිහාසික ලේඛනය තවමත් සම්පූර්ණයෙන් පළ වී නැත.

3. **සද්ධර්මරත්නාවලිය** — ප්‍රාචීන භාෂොපකාර සමාගමය — 1, 1985, සංස්කරණය, පිටු X, XI,

4. **සද්ධර්ම රත්නාවලිය** — ඥාණවිමල, 1961, පිට 1246.

5. **නිකාය සංග්‍රහය** — ඩී. පී. ආර්. සමරනායක, 1966, පිට 81 "**එසේම ශ්ලෝක සිද්ධාර්ථය, සාහිත්‍ය විල්ගම්මුළය, අනුරුද්ධ ය, දීපංකර ය, මයූරපාද ය, ධර්මසේන ය යනාදි ස්ථවිරයන් හා.........**"

6. **දහම්ගැට** — ගන්දර පී. ඩී. ඇස්. වීරසූරිය, 1958, සංස්කරණය, XIX— XX පිටු. ".........දහම්ගැට නමින් පතළ ගී පොතෙහි කතුවරයා සදහම් රුවන්වැළ (=සද්ධර්මරත්නාවලිය) ලියූ හෙළ මහවියතාණ කෙනකු වූ දහම්සෙන් (=ධම්ම-සේන) හිමිපාණ යැ යි පතළ ය...එම සාහිත්‍ය විශාරදයාණන් විසින් ම දහම් ගැට පදර්ථයක් ලියූ බව කටුගෙයි පොත් ගුළෙහි වූ මෙරුපන්කුලමේ පන්සලේ පොත් පිටපතකින් පෙනේ." "ජයවර්ධනපුර පැරකුම්බාවන් ගේ ගුරු වූ රණස්ගල්ලේ ස්ථවිරයන් විසින් ධම්මසෙන තෙරපාණන් ගේ දහම් ගැට පොතට ව්‍යාඛ්‍යානයක් ලියන ලද යි කෞතුකාගාර පුස්කොළ පොත් ලෙඛනයෙහි සඳහන් වෙයි."

7. **Catalogue of Palm Leaf Manuscripts in the Library of the Colombo Museum** – W. A. De Silva, 1938. p. 147, (No. 897). Ms. ends: "..................ධර්මසෙන ස්ථවිරපාදයන් විසින් පාළි ග්‍රහණයෙන් දක්වා උපදවන ලද ධම් ගැට **පදර්ථය**......සැබෙවින් දක්වන ලදී." (Nos. 898 and 899)

8. **දහම්ගැට** සහ **දහම්ගැට පදර්ථ** දෙක ම ඒකකර්තෘක බව යි, ප්‍රචලිත මතය.

9. **Sinhalese Literature** — Dr. C. Godakumbura, 1955, p. 82.

10. **සිංහල සාහිත්‍ය වංශය** — ලේක්හවුස්, 1961, පිට 148.

11. **සිංහල සාහිත්‍යය** — 2, — ආනන්ද කුලසූරිය, 1963, පිට 74.

12. **මයූර සන්දේශ පදර්ථ ව්‍යාඛ්‍යා** — වැලිපටන්විල දීපංකර ස්ථවිර, 1910 (2454), විඥප්ති, පිට iii.

13. **වර්ණනා සහිත හංස සන්දේශය** — පී. ඩී. ඇස්. වීරසූරිය (සංස්කරණය).

14. **ලෝකෝපකාරය** — ආචාර්ය ඇම්. එච්. පීටර් සිල්වා, 1963, 12–18 පිටු.

15. **ජානකීහරණ මහාකාව්‍යය** — රත්මලානේ ශ්‍රී ධර්මාරාම සං., 1891, පිට 305"...... රාමාභිෂෙකොනාම පංචදශස්සර්ගඃ"

16. **ජානකීහරණම්** — පරණවිතාන — ගොඩකුඹුර, 1967 පිටු 224 — 225 "ඉති ශ්‍රී සිංහලස්‍ය කුමාරදසස්‍ය කෘතෞ ජානකීහරණෙ මහාකාව්‍යෙ විංශතිඃ සර්ගඃ සමාප්ති-මගමත් — ශ්‍රීරස්තු."

17. **The Catuhsataka of Aryadeva** — Ed. Vidhusekhara Bhattacharya, Calcutta, 1931, p. 29.
"යොගාචාරෙ චතුඃශතකෙ ශිෂ්‍යවයඨ්‍යාප්‍රකරණම'ෂ්ටමම්"

18. **Cittavisuddhi Prakarana** — Ed. Haraprasad Sastri (Journal of the Asiatic Society of Bengal) (JASB.), 1898, p. 175 f. C.V.P. Ed. Prabhubhai Bhikhabhai Patel (Visvabharati) 1949, (Introduction) p. xii "In the Original MS, the first leaf is missing." (pp. 1–10, Vs. 6 - 134.)

19. **Kavya Laksanam** - Ed. Anantalal Thakur and Upendra Jha, 1957, (Darbhanga), (Introduction), p. 1.
"Of the 124 folia, 11.5 inches by 2.3 inches the first three are missing" pp. 1–2 "දොෂවිභාගතො...........මලලනාගො............වස්පීතිලක්ෂණාවච ලොකයාත්‍රායාඉති" යන්නෙහි සිට ශේෂ ය. මුල් පත් ඉරු තුන අපවත් ය.